00185

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 04 වන මට්ටම

අවසාන පරීක්ෂණය 2022/ 2023

අපරාධ නීතිය - LLU4806

කාලය - පැය තුන (03) යි

---

දිනය : 2024 අප්‍රේල් 04 වේලාව : ප.ව. 1.30 - ප.ව. 4.30

---

මුළු ප්‍රශ්න ගණන : 08

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

විභාග අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.

1. ව්‍යාපාරිකයකු වූ එඩ්වඩ් කොළඹ නගරයට ආසන්න ප්‍රදේශයන්හි පිහිටි නිවාස කිහිපයක හිමිකරු විය. තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා සඳහා ඉගැන්වීම් කෙරෙන පුද්ගලික අධ්‍යාපන ආයතනයක් සමීපයේ ඉන් එක් නිවසක් පිහිටා තිබුණි. එඩ්වඩ් සෑම වසරකම එම නිවස එම අධ්‍යාපන ආයතනයේ ඉගෙනුම ලබන ශිෂ්‍යයන්ට කුලියට දීම කළේය. 2023 වර්ෂයේ ජනවාරි මාසයේ, එඩ්වඩ්, එම ආයතනයේ ශිෂ්‍යයකු වූ ඩිල්ෂාන් ට එම නිවස කුලියට දුන්නේය. කුලියට දීමේ ගිවිසුම ප්‍රකාරව එම නිවස උපරිම වශයෙන් තවත් ශිෂ්‍යයන් හය දෙනෙකු සමග බෙදාගත හැකි විය. ඩිල්ෂාන් ගේ මිතුරන් පස් දෙනෙකු කාමර බෙදා ගැනීමට එකඟ වූ අතර 2023 පෙබරවාරි මාසයේ ඔවුහු එහි වාසය සඳහා පැමිණියහ.

මාසයකට පසුව, මෙම නිවසේ පදිංචි වී සිටින ශිෂ්‍යයන් මත්පැන් සහ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් බවට එහි අසල්වාසීහු පොලීසියට පැමිණිලි කළහ. ඔවුහු තව දුරටත් පැමිණිලි කළේ මෙම ශිෂ්‍යයන්ගේ හැසිරීම නිසා හිරිහැර සිදු වන බවත් වටපිටාවේ නිසංසල බවට එයින් බාධා වන බවත් ය. පසුව, අසල්වාසීන් කළ පැමිණිල්ල මත එඩ්වඩ් පොලිස් අත්අඩංගුවට ගන්නා ලදී.

තම කුලී නිවැසියන්ගේ මෙවැනි හැසිරීමක් පිළිබඳව තමා කිසිසේත් නොදන්නා බවත්, එම නිසා තමා කිසිදු වරදකට වරදකරුවකු නොවන බවත් එඩ්වඩ් කියා සිටියි. නිවාස කුලියට දීම සම්බන්ධයෙන් අදාළ වන නීතියෙහි ප්‍රකාශිතව දැක්වෙන්නේ සදෝෂී මනස නොමැති වීම මෙම නීතිය යටතේ විත්තිවාචකයක් බවයි.

එඩ්වඩ් ගේ සාවද්‍ය භාවය සාකච්ඡා කරන්න. දණ්ඩ නීති සංග්‍රහයේ අදාළ ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

**(ලකුණු 20)**

2. " ...මැක්නෝටන් නඩුවේ දී විනිශ්චයකාර වරුන් විසින් ප්‍රකාශ කරන ලද මතයන්, සිහිවිකලත්වය යන්න අපරාධ නඩුවක දී වලංගු විත්තිවාචකයක් වන්නේ කෙසේද යන ප්‍රශ්නය සම්බන්ධයෙන් ඇති වඩාත්ම බලධාරී විවරණයන් ලෙස සැලකේ .."

*Deorao Vs Emperor*, 1946 AIR 321, at p 330. (as cited in Dr. Hari Singh Gour's Indian Penal Code, 16th Edition 2023 at p 241 )

ඉහත ප්‍රකාශය අනුසාරයෙන් ශ්‍රී ලංකා අපරාධ නීතිය තුළ සිහිවිකලත්වය යන විත්තිවාචකයෙහි මූලාරම්භය සහ පසු කාලීන වර්ධනයන් විවේචනාත්මකව විමසන්න.

**(ලකුණු 20)**

3. මහජන චතුරශ්‍රයේ රැළියකදී ජනප්‍රිය ප්‍රාදේශීය දේශපාලඥයෙකුට වෙඩි තබා මරා දැමීම සඳහා පාතාල අපරාධ කල්ලි දෙකක සාමාජිකයන් වූ සිරා සහ ජෝති වෙන වෙනම පිටත් කර යවන ලදී. එකම කාර්යය සම්පූර්ණ කිරීම සඳහා අනෙකා ව පිටත් කර යවන ලද බව සිරා හෝ ජෝති නොදැන සිටියහ. රැළිය පැවති දිනයේ, සිරා, මහජන චතුරශ්‍රයට ඉහලින් පිහිටි කුළුණක් පිටුපස ස්ථානගත වූ අතර, ජෝති, මහජන චතුරශ්‍රය අසල වූ පාළු ගොඩනැගිල්ලක සඳලු තලයේ ස්ථානගත විය. දේශපාලඥයා රැස්ව සිටි පිරිස ඇමතීමට පටන් ගත් අවස්ථාවේ සිරා සහ ජෝති දෙදෙනාම ක්ෂණයකින් ඔහුට වෙඩි තැබූ අතර තමා ඉලක්කය සපුරා ගත් බව දෙදෙනාම සිතූහ. සිරා සහ ජෝති දෙදෙනාම නිහඬකරයන් (Silencers) භාවිතා කළ බැවින් රැස්ව සිටි කිසිවෙකුටත් වෙඩි හඬ නොඇසුණි. වෙඩි වැදීම නිසා පපුවේ දරුණු තුවාල සහිතව දේශපාලඥයා බිම ඇද වැටුණි. වහාම ඔහු රෝහල් ගත කල අතර හදිසි ශල්‍යකර්මයක් ද සිදු කරන ලදී. කෙසේ වුවද, සිදුවී තිබූ තුවාල හේතුවෙන් ශල්‍යකර්මයෙන් පැය කිහිපයකට පසුව ඔහු මරණයට පත් විය. පශ්චාත් මරණ පරීක්ෂණයේදී අනාවරණය වූයේ ඔහුට එක් වෙඩි පහරක් පමණක් වැදී ඇති බවයි.

CCTV පටිගත වීම් ආධාරයෙන් සිරා සහ ජෝති යන දෙදෙනාවම ලුහුබැඳ ගොස් අල්ලා ගන්නා ලද අතර ඔවුන්ට මිනීමැරුම යන වරද සම්බන්ධයෙන් චෝදනා නැගී ඇත.

සිරා සහ ජෝති ගේ සාවද්‍ය භාවය සාකච්ඡා කරන්න. දණ්ඩ නීති සංග්‍රහයේ අදාළ ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

**(ලකුණු 20)**

4. ජස්ටින්, සීමාසහිත පියෝ ගෑස් සමාගම (Pure Gas Company Limited) නැමැති ගෑස් අලෙවි සමාගමක කම්කරුවෙකි. ජස්ටින් ගේ ප්‍රධාන කාර්යය වන්නේ ගෑස් බෙදා හරින ට්‍රක් රථ වලින් හිස් ගෑස් සිලින්ඩර් පිටතට ගෙන ඒවා නියමිත ගබඩාවෙහි අසුරා තැබීමයි. එක් සිකුරාදාවක, ජස්ටින් සුපුරුදු පරිදි තම දවසේ සේවය නිම කර පිටව ගියේය. පසුදා උදෑසන ගබඩා භාර ෆෝර්මන් වරයාට දැන ගන්නට ලැබුණේ අනුක්‍රමික අංක 1005 දරණ ගෑස් සිලින්ඩරය නැතිවී ඇති බවයි. එදින සේවයේ නිරත එක් ට්‍රක් රථ රියදුරකු කියා සිටියේ පාපැදියක පසුපස ලගේජයේ ගෑස් සිලින්ඩරයක් තබාගෙන ජස්ටින් ගමන් කරනු තමා දුටු බවයි. අංක 1005 දරණ ගෑස් සිලින්ඩරය, ජස්ටින් ගේ සොහොයුරා වූ මාටින් ට අයත් අබලි ලෝහ ද්‍රව්‍ය එක්රැස් කරන අංගනයක තිබී පසුව සොයා ගැනුනි.

ජස්ටින් ට සහ මාටින් ට එරෙහිව සොරකම වරද සම්බන්ධයෙන් චෝදනා ගෙන ආ හැකිද යන්න පිළිබඳව සීමාසහිත පියෝ ගෑස් සමාගම ඔබගෙන් උපදෙස් පතයි. සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

5. "වින්දිතයා කැමැත්ත නොදැක්වූ අවස්ථාවන්හිදී ලිංගික සංසර්ගය සිදු කිරීමට වගඋත්තරකරු චේතනා කල බව ගෙනහැර දැක්වීමේ අවශ්‍යතාවයක් නැත, අවශ්‍ය වන්නේ ප්‍රවේශය සිදු කිරීම චේතනාන්විතව සිදු කළ බවත්, වින්දිතයා කැමැත්ත දුන්නේ ද නැති ද යන්න සම්බන්ධව ඔහු නොසැලකිලිමත්ව කටයුතු කර ඇති බවත් ගෙනහැර පෑමයි."

William, Glanville, *Textbook of Criminal Law*, South Asian Edition 2017, p 462.

ස්ත්‍රී දූෂණය නැමැති වරද සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ නිවැරදි නීති තත්වය ඉහත ප්‍රකාශය මගින් පිළිබිඹු වන්නේද? අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ උචිත නඩු තීන්දු ඇසුරින් විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

6. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන, උචිත නඩු තීන්දු, සහ ප්‍රායෝගික උදාහරණ ඇසුරින් සාපරාධී වගකීමට එරෙහිව ඇති විත්තිවාචකයක් වශයෙන් අවශ්‍යතාවය යන විත්තිවාචකයෙහි තාර්කික පදනම සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

7. විශ්ව, කොළඹ ප්‍රදේශයේ වෙළඳ සැල් කිහිපයකට රූපලාවන්‍ය නිෂ්පාදන සහ සම සුරකින නිෂ්පාදන සපයන පුද්ගලික සමාගමක සේවය කරයි. ඔහුගේ වගකීම වූයේ වෙළඳ සැල් වලින් ඇණවුම් කරන ලද භාණ්ඩ ඒවාට භාර දී ඉන්වොයිසියෙහි සඳහන් ආකාරයට නියමිත මුදල් එකතු කර ගැනීමයි. එසේ එකතු කරගත් මුදල් ඔහු විසින් සෑම සිකුරාදාවකම සමාගමේ බැංකු ගිණුමෙහි තැන්පත් කල යුතුය. එසේ වුවද, 2023 දෙසැම්බර් මාසය තුළ එකතු කල සියලුම මුදල්, එම මාසය අවසානයේදී විශ්ව තමාගේ පෞද්ගලික ගිණුමෙහි තැන්පත් කළේය. ඔහු එසේ මුදල් තමාගේ පෞද්ගලික ගිණුමෙහි තැන්පත් කරගත්තේ ඇයි ද යන්න සමාගම විසින් ප්‍රශ්න කල අවස්ථාවේ විශ්ව කියා සිටියේ තමාගේ පවුලේ අනපේක්ෂිත හදිසි මුදල් අවශ්‍යතාවයක් හේතුවෙන් එසේ කල බවත්, 2024 වසරේ ජනවාරි මාසයේ එම මුදල සමාගමේ ගිණුමෙහි නැවත තැන්පත් කිරීමට තමා අදහස් කරගෙන සිටි බවත් ය.

ඉහත දැක්වෙන අවස්ථාවේ කිසියම් හෝ වරද සිදුකර ඇත්දැයි ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ අදාළ ප්‍රතිපාදන සහ නඩු තීරණ ඇසුරින් සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

8. පහත දැක්වෙන දෑ අතරින් ඕනෑම එකක් සම්බන්ධව සවිස්තරාත්මක සටහනක් ලියන්න.

i). බලවත් සහ හදිසි ප්‍රකෝපය යන ලුහුඬු ආයාචනය.

ii). නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය නැමැති වරද.

**(ලකුණු 20)**

~~ නිමිකම් ඇවිරිණි~~